# නර්තනය - 9 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# 2.3 සාම්ප්‍රදායික නර්තන ඇසුරින් අලංකාර පද නිර්මාණය

**සාම්ප්‍රදායිකව ඔබ ඉගෙන ගත්,**

| | | |
|---|---|---|
| උඩරට | - | ගොඩ සරඹ |
| පහතරට | - | ඉලංගම් සරඹ |
| සබරගමු | - | දොඹින පද |

ඒ ඒ සම්ප්‍රදායයන් අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් ලබාගත් කුසලතාව මෙහි දී වඩාත් වැදගත් වේ. සාම්ප්‍රදායික චලන අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. අලංකාර පද යොදා ගනිමින් නිර්මාණය කරන ලද නර්තන අංගයක සෞන්දර්යාත්මක වටිනාකම තීව්‍ර කර ගත හැකි ය.

පහළ තලය, මැද තලය, ඉහළ තලය යන තල භාවිතය කෙරෙහි අවධානය යොමු කර මූලික සරඹ නිර්මාණය වී ඇති අතර ඒවා තව දුරටත් අලංකාර වන අයුරින් පද නිර්මාණය කිරීම කෙරෙහි ඔබේ අවධානය යොමු කළ යුතු ය.

## අලංකාර පද නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- උඩ පැනීම, කැරකීම, වාඩිවීම, දෙපසට ගමන් කිරීම වැනි ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීම.
- අලංකාර පද නිර්මාණය සඳහා තෝරා ගන්නා චලන හා එහි අංගහාර සම්ප්‍රදායය අනුව යොදා ගැනීම.
- මාත්‍රා 4 + 4 තාල රූපය කෙරෙහි අවධානය යොමු කිරීම.
- නිර්මාණය කර ගත් අලංකාර පද නිරන්තරයෙන් අභ්‍යාස කිරීම.
- බෙර වාදනයට අනුව නර්තනයෙහි යෙදීම.
- ප්‍රාසාංගික බවින් යුක්ත මාත්‍රා නිර්මාණය කිරීම.

## අලංකාර පද නිර්මාණය කිරීමේ වැදගත්කම

- අලංකාර පද නිර්මාණය කිරීම මගින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කර ගැනීමට හැකි වීම.
- ඒකල ව හා සාමූහික ව රසවින්දන ශක්තිය වර්ධනය කර ගැනීමට හැකි වීම.
- නිර්මාණ කුසලතා වර්ධනය වීම.
- නිර්මාණය කරන ලද අලංකාර පද වෙනත් අවස්ථා සඳහා භාවිතයට ගත හැකි වීම.

## කාර්ය පත්‍රිකාව

**01.** අලංකාර පද සඳහා සුදුසු චලන නිර්මාණය කරන්න.

**02.** මාත්‍රා 4 + 4 කවියක් තාල රූපයට නිවැරදි අංගහාර භාවිත කරමින් අලංකාර පද 2 ක් ඉදිරිපත් කරන්න.

**03.** නිර්මාණය කර ගත් අලංකාර පද බෙර වාදනයට අනුව ඒකල ව හෝ සාමූහික ව හෝ නර්තනය කරන්න.

**04.** ඔබ විසින් නිර්මාණය කරන ලද අලංකාර පද යොදා ගත හැකි වෙනත් අවස්ථා දෙකක් නම් කරන්න.